# තරග නීති රීති

තරගයට ඇතුල්වීම සඳහා කරුණාකර පහත නීතී රීති අනුගමනය කරන්න.තරග නීතී වලට පටහැනි ඉදිරිපත් කිරීම් තරගයෙන් ඉවත් කිරීමට සිදුවන අතර නැවත අයදුම්කරුවන් වෙත එම නිර්මාණ ලබාදීමට නොහැකි බව කරකරුණාවෙන් සලකන්න.

**තරගයට අයදුම් කිරීම:**

තරගය සඳහා අයදුම් කරන දිනට වයස අවුරුදු 18 ට වඩා අඩු දරුවන් මේ සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබයි. නිර්මාණ සඳහා වැඩිහිටියන්ගේ සහය ලබාගැනීම හෝ කෘතිම බුද්ධිය (Artificial Intelligence) භාවිතා කිරීම නොකල යුතුය. ලෝකයේ ඕනෑම රටක සිට මේ සඳහා නිර්මාණ ඉදිරිපත් කල හැක.

නිර්මාණය පහත වයස් කාණ්ඩ යටතේ ඉදිරිපත් කල හැක:

- 0-5 years
- 6-9 years
- 10-14 years
- 15-18 years

නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා ඇතුල්වීමේ ගාස්තුවක් අයකර ගනු නොලැබේ.

**එක තරගකරුවෙකුට එක නිර්මාණයක් පමණක් ඉදිරිපත් කල හැකි අතර, උපරිමය නිර්මාණ 50ක් දක්වා වූ නිර්මාණ කට්ටලයක් එක් පාසලකින් තැපල් කිරීමට හැක.**

එක් පාසලකින් සිසුන් 50 කට වඩා ඉදිරිපත් වීමට අවැසි අවස්ථාවල, නිර්මාණ 50 ක් දක්වා වන කට්ටලයට ඔබේ නිර්මාණය ඇතුලත් නොවේ නම්, එවැනි අවස්ථාවක තනි අයදුම්කරුවෙකු ලෙස ඔබගේ නිර්මාණය තැපැල් මාර්ගිකව ඉදිරිපත් කිරීමට ඔබට හැක.

එකම පවුලේ සාමාජිකයන්ට තනි පාර්සලයක් ලෙස නිර්මාණ තැපැල් කල හැක.

ඉදිරිපත් කරන සියලුම නිර්මාණ ජාත්‍යාන්තර බකමූණු ආයතනයේ (International Owl Center) හිමිකම් වලට යටත් වන අතර තරගය සඳහා ලැබෙන අති විශාල නිර්මාණ ප්‍රමාණය හේතුවෙන් නිර්මාණ නැවත තරගකරුවන් වෙත් ලබාදීමට අපොහොසත් වන බව කරුණාවෙන් සලකන්න.

ඉදිරිපත් කරණු ලබන ඇතැම් නිර්මාණ සැරසිලි, ආධාර මුදල් එකතු කිරීමේ කටයුතු, ප්‍රවර්ධන කටයුතු හෝ මුද්‍රිත නිර්මාණ අලෙවිය සඳහා යොදා ගන්නවා ඇත. ඒ කෙසේද යත් ඇතැම් නිර්මාණ ජාත්‍යාන්තර බකමූණු උත්සවය සඳහා වන සැරසිලි කටයුතු වෙනුවෙන්ද, වසර පුරා විවිධ උත්සවය සඳහා වන සැරසිලි කටයුතු වෙනුවෙන් ද, ජාත්‍යාන්තර බකමූණු මධ්‍යස්ථානයේ පිහිටි තෑගි භාණ්ඩ අලෙවි සැලේ විකිණීමටද, ආධාර මුදල් රැස්කිරීම් වලට අදාල කටයුතු වලදී වෙන්දේසි කිරීමටද, කෞතුකාගාර, චිත්‍රාගාර වල තාවකාලි ප්‍රදර්ශනය සඳහාද, අලවිය සඳහා වන සුබ පැතුම්පත් නිෂ්පාදනය සඳහාද, ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් කරනු ලබන ඇඳුම් හා වෙනත් ප්‍රවර්ධන භාණ්ඩ වෙනුවෙන් ද මෙම නිර්මාණ යොදා ගන්නවා ඇත.

***තරගය සඳහා ඇතුල් වීමෙන් අනතුරුව, සියලුම නිර්මාණ International Owl Center හී අයිතියට නතුවන බව සියලුම තරගකරුවන් වෙත මින් දන්වා සිටී. එම නිර්මාණ තරගය සඳහා සුදුසුකම් නොලබන අවස්ථාවලදී උව, නැවත තරගකරුවන් වෙත ලබාදීමට නොහැකි බව කරුණාවෙන් සලකන්න.***

## මාධ්‍ය Media:

ඉදිරිපත් කරණු ලබන සියලු නිර්මාණ වල බකමූණුනෙකුගේ රූපයක් තිබීම අනිවාර්ය වේ. ද්විමාන නිර්මාණ පමණක් ඉදිරිපත් කල හැක. ඕනෑම ප්‍රමාණයක කඩදාසි යොදාගත හැකි අතර ඒවා තැපැල් මාර්ගිකව එවීමට හා බිත්ති මත ඇලවීමට සුදුසු ප්‍රමාණයෙන් නිර්මාණය කිරීමට වගබලා ගන්න. ඉදිරිපත් කිරීම් සඳහා අමුද්‍රව්‍ය ලෙස ශාක හෝ සත්ව කොටස් ( තණකොළ, බීජ, සත්ව කෙඳි, පිහාටු හා වෙනත් ශාක හෝ සත්ව කොටස්) යොදා ගැනීම සපුරා තහනම් වන අතර එය ජාත්‍යන්තර ප්‍රවාහන නීතිවලට පටහැනි වේ.

ඩිජිටල් මාධ්‍ය භාවිතා කර කරණු ලබන නිර්මාණ, ඩිජිටල් නිර්මාණ ලෙස නම් කර මුද්‍රණයකර තරග සඳහා ඉදිරිපත් කිරීමට කාරුණික වන්න. ඩිජිටල් නිර්මාණ සඳහා කෘතිම බුද්ධිය යොදා ගැනීම තහනම් වේ.

රාමු නොකරන ලද නිර්මාණ පමණක් තරගය සඳහා වලංගු වේ. **නිර්මාණ සඳහා කැන්වස් රෙදි භාවිතා කරන අවස්ථා වලදී, අවසන් නිර්මාණය රාමුව ඉවත්කොට ඉදිරිපත් කිරීමට කාරුණික වන්න. එසේ නොවුනොත් අදාළ නිර්මාණ තරගයෙන් ඉවත් කිරීමට සිදුවෙනු ඇත.** ඉතා තුනී සහ පහසුවෙන් හානිවීමට හැකි කඩදාසි නිර්මාණ සඳහා යොදාගන්නා අවස්ථාව වලදී, තැපැල් මාර්ගික ප්‍රවාහනයේදී සිදුවිය හැකි හානි වලක්වා ගැනීමට එවැනි නිර්මාණ සනකම කාඩ්බෝඩ් පසුබිමක් මත තබා ආරක්ෂාකාරීව ලැබීමට සලස්වන්න.



බකමූණෙකුගේ රූපයක් සහිත නිර්මාණ පමණක් ඉදිරිපත් කරන්න.



ඉදිරිපත් කිරීම් සඳහා අමුද්‍රව්‍ය ලෙස ශාක හෝ සත්ව කොටස් ( තණකොළ, බීජ, සත්ව කෙඳි, පිහාටු හා වෙනත් ශාක හෝ සත්ව කොටස්) යොදා ගැනීම සපුරා තහනම් වේ.



රාමු කරන ලද නිර්මාණ භාර නොගැනේ.



**නිර්මාණ සදහා කැන්වස් රෙදි භාවිතා කරන අවස්ථා වලදී, අවසන් නිර්මාණය රාමුව ඉවත්කොට ඉදිරිපත් කිරීමට කාරුණික වන්න. එසේ නොවුනොත් අදාළ නිර්මාණ තරගයෙන් ඉවත් කිරීමට සිදුවෙනු ඇත.**



ඩිජිටල් මාධ්‍ය භාවිතා කර කරණු ලබන නිර්මාණ, ඩිජිටල් නිර්මාණ ලෙස නම් කර මුද්‍රණයකර තරග සදහා ඉදිරිපත් කිරීමට කාරුණික වන්න.

**ඉදිරිපත් කිරීම:**

සියලුම නිර්මාණ නිසිලෙස ලේබල් කර තිබිය යුතුය. අදාළ අයදුම්පත්‍රය මුද්‍රණය කර (**Print out this form**) කුඩා ලේබලය නිර්මාණයේ ඉදිරිපස දකුණු පැත්තේ පහල කෙළවර තනි පැත්තක් පමණක් ඇලවෙන ටේප් භාවිතා කර අලවා ගන්න ( නිර්මාණය මත නොව දකුණු පස පහල කෙලවර පමණක් ටේප් පටය ඇලවිය යුතුය). ප්‍රධාන අයදුම්පත්‍රය නිර්මාණයේ පසුපස තනි පැත්තක් පමණක් ඇලවෙන ටේප් මගින් අලවා ගන්න. ඇලවීමේ මාධ්‍ය ලෙස ගම්, රබර් පල්ප, දෙපසම ඇලවෙන ටේප් භාවිතා නොකරන්න. අයදුම්පත්‍රය ටේප් භාවිතයෙන් පමණක් නිර්මාණ මත ඇලවීමට අපහසු අවස්ථාවලදී, ඒ සදහා ෆයිල් කටුවක් භාවිතා කල හැක. **ඉවත් කිරීමට අපහසු ඇලවීමේ ද්‍රව්‍ය භාවිතා කොට අලවන ලද ලේබල් සහිතව එවනු ලබන නිර්මාණ තරග සදහා නිර්දේශ නොකරනවා ඇත.** ලේබලය පහසුවෙන්

නිර්මාණයෙන් වෙන්කර ගත හැකි විය යුතු අතර එවැනි නිර්මාණ Owl Center තාගාය භාණ්ඩ විකුණුම් සැලෙහි අලවිය සඳහාද, ආධාර මුදල් එකතු කිරීම සම්බන්ධ ප්‍රචාරක කටයුතු සඳහාද, International Owl Awareness Day නිමිති කොට ගෙන පැවැත්වෙන ටී ෂර්ට් ආදී අලෙවි ප්‍රචාරක භාණ්ඩ සඳහා ද, අලෙවිය සඳහා වන සමරු තිළිණ සහ සමරු පත් වලද, විවිධ වෙනත් නිර්මාණ කටයුතු වෙනුවෙන් ද යොදා ගන්නා බව කරුණාවෙන් සලකන්න.



කුඩා ලේබලය නිර්මාණයේ ඉදිරිපස දකුණු පහළ කෙළවර අලවන්න. ඉහත රූපයේ පෙන්වා ඇති පරිදි දකුණු පස පහළ කෙළවර අලවා ඇති ටේප් පටියේ ඉතිරි කොටස නිර්මාණයේ පසුපසට නවා අලවාගන්න.



විශාල ලේබලය නිර්මාණයේ පසුපසට අලවාගන්න. ඉහත රූපයේ පෙන්වා ඇති පරිදි, ලේබලයේ ඉහළ දාරය පමණක් **තනි** ටේප් පටයකින් අලවා ගන්න.



පැත්තක් පමණක් ඇලවෙන ටේප් භාවිතා කරන්න
Use single-sided tape.



දෙපසම ඇලවෙන ටේප් භාවිතා නොකරන්න.




ගම් වර්ග භාවිතා නොකරන්න.



ස්ටේප්ලර් කටු භාවිතා නොකරන්න.



- පෝස්ටර් ඇළවීමට භාවිතා කරන




කඩදාසි හෝ සිමෙන්ති
පල්ප භාවිතා නොකරන්න
No paper or rubber
cement

ඇලවුම්කාරක භාවිතා
නොකරන්න.



කුඩා ලේබලය නිර්මාණයේ පිටුපස ඇලවීමෙන් වළකින්න.



ලේබලයේ සියලු කොන් ආවරණය වන
පරිදි ටේප් පටිය ඇලවීමෙන් වළකින්න.

**අයදුම් පත්‍රය පැහැදිලි අත් අකුරින් පිරවීමට** හෝ  ටයිප් කිරීමට හැක. ජයග්‍රාහකයින්ගේ තෑගි හා සහතික පත්‍ර අයදුම් පත්‍රයේ සඳහන් ලිපිනයට යොමු කරන බැවින් නිවැරදි ලිපිනයක් ලබාදීම ඉතා වැදගත් වෙයි.අවශ්‍ය නම් පාසලේ ලිපිනය වුවද මේ සඳහා යොදා ගත හැක.

පහතින් දක්වා ඇති link එකෙහි අඩංගු වීඩියෝව නිර්මාණයක් නිවැරදිව ලේබල් කරගන්නා හා තැපැල් කරන ආකාරය පෙන්වා දෙයි. **[Click here to see a video of how to properly label and mail entries.]** **නිසි ලෙස ලේබල් කර නොමැති නිර්මාණ තරගය සඳහා භාර නොගන්නා අතර නිර්මාණකරුවන් වෙත නැවත ලබා දීමක් සිදු නොකෙරේ.**

*ප්‍රවාහනයේදී සිදුවන හානිවීම් වළකා ගැනීම සඳහා නිර්මාණ කාඩ්බෝඩ් හෝ ගණකම් ඇසුරුමක් සහිත බහාලුම් වල දමා තැපැල් කරන්න.

නිර්මාණය මුල් පිටපත අප වෙත ලැබීමට සලස්වන්න. ඡායා පිටපත් හෝ ඊමේල් කරන ලද නිර්මාණ තරගයේ සඳහා භාරගනු නොලැබේ. **සියලුම නිර්මාණ 2025 වසරේ ජනවාරි මස 15 වන දිනට ප්‍රථම අප වෙත ලැබිය යුතුය.**

තැපැල් මාර්ගිකව නිර්මාණ අප වෙත ලැබීමට සති කිහිපයක් ගතවන බැවින් ඔබගේ නිර්මාණය කල් වේලා සහිතව අප වෙත ලැබීමට සලස්වන්න. ඇතැම් රටවල සිට නිර්මාණ අපවෙත ලැබීමට සති තුනක් හතරක් අතර කාලයක් ගත වන අතර, ඇතැම් අවස්ථාවල එය සති හයේ සිට අට දක්වා දීර්ඝ විය හැක. කිසිදු නිර්මාණයක් ජනවාරි 15 වන දිනෙන් පසුව භාර නොගන්නා අතර, ප්‍රමාද වී ලැබෙන නිර්මාණ ඊළඟ වසරේ තරඟය සඳහා තබා ගැනීමක් සිදු නොකෙරේ.

<u>වැදගත්</u>:

<u>නිසි තැපැල් ගාස්තු ගෙවා නිර්මාණය අප වෙත ලැබීමට සලස්වන්න. නිසි තැපැල් ගාස්තු ගෙවීමට අපොහොසත් වන නිර්මාණ, තරගය සඳහා සුදුසුකම් නොලබයි.</u>

**පහතින් දක්වා ඇති ලිපිනය වෙත ඔබගේ සියලු නිර්මාණ තැපැල් මගින් යොමු කිරීමට වග බලාගන්න:**

International Festival of Owls
PO Box 536
Houston, MN 55943
USA

**DHL, UPS හෝ FedEX මගින් එවනු ලබන නිර්මාණ සඳහා පහත ලිපිනය භාවිතා කරන්න.**

International Owl Center
126 E Cedar St
Houston, MN 55943
USA
+1 507-896-6957

වැදගත්:

***ලිපිනයේ, Houston, MN යන කොටස නිවැරදිව සඳහන් කරන්න. ඇමරිකා එක්සත් ජනපදයේ තවත් Houston යනුවෙන් බොහෝ කුඩා නගර ඇති නිසා, ඔබගේ නිර්මාණය වැරදි ලිපිනයකට යාම එමගින් වැළැක්වේ.***

**විනිශ්චය පටිපාටිය හා ත්‍යාග:**

වලංගු ඊ මේල් ලිපිනයක් සහිතව ඉදිරිපත් කරන සියලුම නිර්මාණ සඳහා සහභාගිත්වය වෙනුවෙන්, මුද්‍රණය කිරීමට හැකි සහතික පත්‍රයක් විද්‍යුත් තැපැල් (e- mail) මාර්ගිකව ලැබෙනවා ඇත. ලැබෙන අතිවිශාල නිර්මාණ ප්‍රමාණය නිසා එම සහතිකයන්හි නිර්මාණකරුවාගේ නම අඩංගු කිරීමට නොහැක. නමුත් එම සහතිකපත් අදාළ නිර්මාණකරුවා ගේ නම යොදා මුද්‍රණය කල හැකි පරිදි සකසා ඇත. පාසල් මගින් ලැබීමට සලස්වන නිර්මාණ කට්ටල සඳහා එක PDF සහතික පතක් ලැබෙන අතර නිර්මාණ භාරව කටයුතු කරන ගුරුමහතුන් හෝ ගුරුමහත්මීන්ට අවශ්‍ය සහතික ප්‍රමාණය ශිෂ්‍යයන් ගේ නම ඇතුලත් කොට එමගින් මුද්‍රණය කල හැක.පාසල් මගින් එවනු ලබන නිර්මාණ කට්ටල සඳහා පාසලේ හෝ නිර්මාණ භාරව කටයුතු කරන ගුරුවරයාගේ විද්‍යුත් තැපැල ( e-mail) ඇතුලත් කරන්න. මීට අමතරව අදාල දරුවාගේ හෝ දරුවාගේ භාරකරුගේ විද්‍යුත් තැපැල ( e-mail) ඇතුළු කිරීමට අමතක නොකරන්න.

තරග නීති රීතිවලට අනුකූලව ලේබල් කරන ලද නිර්මාණ පමණක් බාර ගැනීමට ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලය කටයුතු කරනවා ඇත.

ජයග්‍රාහකයන් තේරීමේදී පහත කරුණු විනිශ්චය මණ්ඩලය විසින් සලකා බලනවා ඇත.

- නව ආරක ඉදිරිපත් කිරීම්
- වෙනස් කෝණයකින් කරන ඉදිරිපත් කිරීම්
- නිර්මාණය තුළින් ඉදිරිපත් කරන පණිවුඩය
- නිර්මාණය සඳහා භාවිතා කරන මාධ්‍යය කුසලතාව (නිර්මාණය තුළින් ඉදිරිපත් කරන පණිවිඩයේ ප්‍රබලතාවය වඩාත් වැදගත් වේ)
- නිසි වර්ණ සංයෝජනය මගින් නිර්මාණයේ ඇති කලාත්මක ලක්ෂණ ඉස්මතු කිරීමේ හැකියාව
- නිර්මාණය සඳහා යොදාගන්නා මෙවලම් භාවිතය
- හාස්‍යය

සෑම වයස් කාණ්ඩයකම පළවන දෙවන හා තෙවන ජයග්‍රාහකයන් සඳහා ජයග්‍රාහකයාගේ නම ඇතුළත් රාමුකරන ලද අත්සන යෙදූ වැක්ස් මඟින් සීල් කරන ලද සහතික පත්‍රයක් තැපැල් මාර්ගිකව ලබාදීමට කටයුතු කරනවා ඇත. පෙබරවාරි මාසයේ මැද භාගය වන විට අදාළ අංශවල ජයග්‍රහකයන් ඊ මේල් පණිවුඩයක් මගින් දැනුවත් කිරීමට කටයුතු කරනවා ඇත. මාර්තු මාසේ මැද භාගය වන විට ජයග්‍රාහකයින්ට ඔවුන්ගේ සහතික පත්‍ර තැපැල් මාර්ගිකව ලබාදීමට කටයුතු සලස්වා ඇති අතර ජයග්‍රාහී නිර්මාණ වෙබ් ( this website) පිටුවෙහි පළ කරනවා ඇත.එසේම ලැබෙන විවිධ නිර්මාණවල එකතුවක් සහිත ඡායාරූප පෙබරවාරි සහ මාර්තු මාසවල facebook ( public Facebook page) පිටුවෙහි පළ කිරීමට සංවිධායකයින් කටයුතු කරනවා ඇත. ලැබෙන අති විශාල නිර්මාණ ප්‍රමාණය හේතුවෙන් සියලුම නිර්මාණ facebook පිටුවෙහි පළ කිරීමට නොහැකි වන අතර, facebook පිටුවෙහි පළ කරන ඡායාරූපවල අඩංගු නිර්මාණයන්හි අයිතිකරුවන් වෙත ඒ පිළිබඳව දැනුම් දීමට නොහැකි බව කරුණාවෙන් සලකන්න.

කෞතුකාගාරයන්හි හා කලාගාරවල ප්‍රදර්ශනය සඳහා යොදා ගන්නා හෝ ටී ෂර්ට්, සමරු පත් හෝ වෙනත් කලා කටයුතු සඳහා භාවිතා කරන නිර්මාණවල අයිතිකරුවන් වෙත ඒ පිළිබඳව දැනුවත් කිරීමට සංවිධායක මණ්ඩලය උපරිම උත්සාහය දරනවා ඇත.

**වැදගත් දිනයන්**
අයදුම්පත් බාර ගන්නා ආරම්භක දිනය: Aug. 15, 2024
අයදුම්පත් බාරගන්නා අවසන් දිනය: Jan. 15. 2025*
අවසන් විනිශ්චය ඉදිරිපත් කරන දිනය: Feb. 28, 2025
*ජනවාරි 15 වන දිනට පසුව ලැබෙන කිසිම නිර්මාණයක් බාර නොගන්නා බව කරුණාවෙන් සලකන්න.

දැනගැනීමට කිසියම් කරුණක් වෙතොත්, පහත ඇති ඊ මේල් ලිපිනය වෙත ඒ බව යොමු කරන්න;
andie@internationalowlcenter.org